දහ අට සන්නිය

නංගල්ලේ ඇස්. එච්. සව්රිස් සිල්වා

''දහ අට පාළිය'' යනුවෙන් ඇතැමෙකු හඳුන් වන දහඅට සන්නිය, බිත සන්නි අමුක්කු සන්නි, ගුල්ම සන්නි, වෙඩි සන්නි, කණ සන්නි, කොර සන්නි, බිහිරි සන්නි, වාත සන්නි, ගොළු සන්නි, පිස්සු සන්නි, මූර්කු සන්නි, කෝල සන්නි, නාග සන්නි, දෙමළ සන්නි, බූත සන්නි, අබූත සන්නි, ගිනිජල් සන්නි, දේව සන්නි, යන නැටුම් ස්වරූප දහ අටකින් සමන්විත වූ නැටුම් සමූදයයකි.

''සන්නිය'' යන්න වෙනුවට ''පාළිය'' යන්න යෙදුණේ, පාළිය යන වචනයේ ස්වරූපය තුළ සන්නිය යන අරුත ද ඇති නිසා විය හැකි ය. හෙවත් එක පවුලේ වගා වී එන වචන නිසා විය හැක.

දහ අට සන්නිය හඳුන්වන ''දහ අට පාළිය'' යන්නෙන් ඇතැම් විටක වැදිසන්නිය අදහස් කිරීමට ආයේ කෙසේ දැ යි සිතාගැන්ම අසීරුය. කෙසේ වුවත්, එය මීට අදළ වන්නක් නො වේ. දහ අට පාළිය යන්නෙන් අදහස් වන, දහ අට සන්නිය ගැන, කරුණු ටිකක් කියුම මේ ලිපියේ පරමාර්ථය වේ.

දහ අට සන්නි පුවත ''සංඛපාල'' රජු සමය තරම් පැරණිය. සංඛපාල රජුගෙන් පටන් ගෙන ''කෝල'' කුමරුගෙන් හෙවත්, සන්නියකුගෙන් ඉවරවූ, මෙම දහ අට සන්නියේ කතාව, රාජ්‍යෝදය කීපයක් තුළ පොෂණය වූවකි.

එහි එන රාජවලියෙහි සංඛපාල විචිත්‍ර සන්සුන්ග යන රජවරුද, පදුමුත්තර, විබිලිත, රත්ගල් කුමාරී යන බිසෝ වරු ද වූහ. ප්‍රෙත අත් බැවින් චුත වූ සන්නියකුගේ පෙළ පත කියන හැටියට, විචිත්‍ර රජු එහි මූලිකයා ය. එම රජුගේ බිසව විබිලිත නමී. එ ම යුවලගේ දියණිය රත්ගල් කුමාරී ය. රත්ගල් කුමරියගේ හිමි සන්සුන්ග රජු ය. එම යුවලගේ පුතු ''කෝල'' ය.

කෝලගෙන් අන්තය දුටු, මෙම සන්නියක් කතා පුවත තුළ රාජ්‍යෝදය කීපයක් වූයේ පමණක් නොවේ. බුද්ධාන්තර ද කීපයක් වූයේ ය. කතා පුවතේ ආදීම නගරය වූ සංඛපාල නුවර ද, වරෙක මන්දර යන නම ගත්තා පසුව විශාලා නම් නුවර වූවා ය.

මෙ සේ කාලය සමග පැහිරෙමින් රාජ්‍යෝදය කීපයෙක එහී ආ කෝලගේ ආදි, අන්තය දැක්වෙන පරපුර නොහොත් දහ අට සන්නියේ ආදි මද්ධ්‍ය පරියොසානය කියන පෙළපත් සටහන මෙ සේ ය.

1. සංඛපාල නුවර

සංඛපාල (රජු) — පදුමුත්තර (බිසව)

වධකමාන

2. වධකමාන (පුතු) — පදුමුත්තර (මව)
(රෞරවනිරයේ) (රෞරවනිරයේ)

3. මන්දර නුවර

වධකමාන පදුමුත්තර
(ප්‍රේත) (ප්‍රේත)

4. විසාලා නුවර (ලිච්ඡවී)

විචිත්‍ර (රජ) = විබිලිත (බිසව)

සන්සුන්ග (රජ) = රත්ගල් කුමාරී
(බිසව) (පදුමුත්තර)

කෝල (මෙද සන්නියකු) (වධකමාන එද)

මේ වූ සියලු කාලාන්තරය තුළ සන්නියක් පුවත වගා වී ආයේ, සංඛපාල රජුගේ බිසව, දසියට නො දී මී අඹයක් කෑමේ, වෛරය නිසා, දසිය බිසවට කළ සොර සැමි චොදනාව මත ය. බිසව කෙරෙහි කිපුණු රජු බිසව මැරවී ය. එවකට ගැබේ සිටි දරුවාය කෝල කුමරු. නිර්දෙෂ මව මැර වූ නිසා, පියාගෙන් පලි ගෙන නුවර වන සන්ට එ ද කළ පැතුම අයුරු, අත් බැවක් පාසාම ඔවුනතර විය කෝල. පලිගැනීමට නිසි අවස්ථාව දුටු ඔහු, රත්ගල් කුමරියගේ කුස, ඇසළමස පුර දසවක් ලත් ගුරු දින, දෙනටෙ නැකත බලා නපුරු සිහින පෙන්වමින් පිළිසිඳ ගත්තේ ය. දස මස් ඉක්ම ගියේ බක් මස පුර සතවක් ලත් බුද දින, චන්ද්‍ර හෝරාව ලත් සිංහ ලග්න ගත බෙරණේ නැකතින් කෝල කුමරු මෙලොව දුටුවේ ය.

විය පැමිණි කුමරු වන වැදුනේ ය. යක්වෙස් මැවුනේ, පිරිවර ද වූයේ ය. දහ අටක් වූ පිරිවර ගුලි දහ අටක් මවා වැලඳූහ. එකෙණෙහි වියරු වූහ. දහ අට වර්ගයක කොල අතු ද කඩා පැලඳගත්හ. ඉහතින් සඳහන් වූ දහ අට විධියේ සන්නිද මවාගත්හ.

මෙ සේ සන්නි මවාගෙන එද පැතුම පරිදි විසාලා නුවර දෙවනත් කළ පිරිසෙහි ප්‍රධානයා වූයේ සන්නියකු ය. ඇදුරා විසින් සන්නියකු අමතන්නේ දහ අට වණ්ණේ භොජන ඇතිව, දහ අට වඟේ කොල මාලා ඇතිව, දහ අට විධියේ ගොටු ඇති ව, දහ අට පහන් වැටි හා දහ අට පඬුරු ඇතිව, පුද සලසා විවිධ වූ මන්ත්‍ර මාලාදිය කියමිනි.

ඉක්බිති යකු ප්‍රිය වන සත් පාළිය ය යි සම්මත පිරිවර නැටුම් පවත්වනු ලැබේ. එම පන්දම් පාළිය, සලු පාළිය, කෙන්ඩි පාළිය, තැඹිලි පාළිය, දලුමුර පාළිය, කලස් පාළිය, කුකුල් පාළිය, යන මේ සත් පාළිය අන්තයේ අතු පාළිය ද පැවැත් වූ විට, සන්නියකු පැමිණේ. සංඛපාල රජු පටන් වූ ඔහුගේ මුලු මහත් ඉතිහාසය ම ඒ ආ විට කියැවේ. ඉනික්බිති ඔහු පුද පඬුරු ලබාගෙන, ඉවත ගිය විට, ඔහුගේ පිරිවර වූ දහ අට සන්නිය, දහ අට වෙස්ගෙන දහ අට වරට පැමිණෙති.

සත් පාළි නැටුමට එන නැට්ටුවා මෑතක පටන් යක් මුහුණක් පැලඳගෙන ඒමට, පුරුදු ව සිටිතත්, එය අවිචාරයේ ආ පුරුද්දක් බව පෙනේ. සත් පාළිය පරිවාර නැටුමකි. සන්නියකු කැඳවීමට ය, ඒ යකු ප්‍රිය මනාප වූ සත් පාළිය නටනුයේ. එ සේ වූ කල්හි පාළි නැටුමට යක් මුහුණක් කෙසේ නම් අයිති විය හැකි ද?

දහ අට වරට පැමිණෙන එක් එක් සන්නිය විසින් බඳින ලද මුහුණෙන් හා සිරුරෙන් ගත් විලාසයෙන් චරියාවෙන්, ගමනින් හා බසින් ද, එම සන්නිය අන්වර්ථ කරනු ලැබේ. සන්නියේ අර්ථය ළඟන්වනු ලැබේ. තව ද පැහැදිලි කරතොත් ගොළු සන්නියට එන නැට්ටුවා, මුහුණින් හැසිරීමෙන්, ආදී හැම ඉරියව්වකින් ම තමා ගොළුවකුබව පෙන්වයි. සෙසු සන්නි විශෙෂ සම්බන්ධයෙන් ද, මෙය මෙ සේ පොදු ය.

දහ අට සන්නි නැටුම සන් ඇදුරා අරඹනුයේ එයට පේවූ, පහත එන අවසර වරම් කවි කියා දේව බල ලබමිනි.

නා ලොව බඹ ලොව දෙවියන් සර ණේ
මේ ලොව සැම තැන මක්කම සර ණේ
ගුරුවර නැණ පවතින මුළු දෙර ණේ
දුටුවත් වරදක් ඉවසන් මගෙ ණේ

සමන් පතිනි ගණ දෙවියන් වරමි න
ලකවට පායන ඉර සඳ වරමි න
මිහිකත් ගණ දෙවි සැම දෙවි වරමි න
මමත් කියමි කවි සන්නිය සමගි න

දහ අට සන්නියේ එන කව්, එක එක සන්නියේ හැටි මේ මේ සේ ය යි ලක්ෂණ විසින්, වෙන් වෙන් ව අනාවරණය කරයි. ඒ අයුරු සලකත, රැ නිදිගත් විට, ගෙල කඩන්නට මෙන් පිරිසක් පැන, අතුපතු සොල්ලා බිය කරන බව පළ වුනි නම් ඒ බීත සන්නිය යි. බීතසන්නි යකුට නිල්වන් බත් හිමි ය.

ගිනි ජල් වෙලුණු බඳු ව පපුව දැවෙන බව නෙත් රතු ව ඉසරදයේ බව හා අරුචි ව බඩ පෙරලුමේ බව පළ වූ නම්, ඒ අමුක්කු සන්නිය ය. පුදබලා ආ අමුක්කු සන්නි යකුට භූත විද්‍යාවේ හැටියට පැනිත් සමග බත් ගොටු ලැබේ.

බඩ ඕගාමින්, වැටි පෙරලෙන බඳු ව, රුජා ව ගෙන, කැවිලි අපිරි බවේ නම් එහෙත් පැණි රස රිසි කෙරේ නම් ඒ ගුල්ම සන්නිය වේ. ගුල්ම සන්නි යකු පුළුටු සහිත ගොටු ගනී.

කණයට ගෙඩි ගැනි නම්, ඉන් ලේ සාරේ යේ නම්, මූණ ගිනි ජල් වෙළුණු බඳු ව දැවේ නම්, දැත දෙ පයේ දඩිය වේ නම්, භූත විද්‍යාව දුටු හැටියට ඒ වෙඩි සන්නිය වේ. එම යකුට තෙල් සහිත වූ ගොටු ලැබේ.

ඇහ කැරකෙන සේ හැහෙමින් ගිනි ලන බවක වීනම් නෙත් නො පෙනී ගොස් ඉසරදයේ නම්, පිත් අධිකව උමතුවක මෙන් වී, තුන් යම සිහින පෙනෙන බවක වීනම් ඒ කණ සන්නියය. කිරි සහිත ගොටු හිමිය ඔහුට.

ගිනි ගත් බඳු ව, සන්ධි තද වී, නිතොර රුජා කෙරේ නම්, අත් පා කොර බවක වේ නම් ඒ කොර සන්නිය වේ. එ ම යකු පුද ඉල්ලු විට ලේ පාටින් බත් ගොටු ලැබේ.

විදුලිය බඳු වේගයෙන්, කෙළ ඇවිදින සේ සහ මකුළු දැලක, වැටෙන බවක සිහින දකින බව කීනම් ඒ බිහිරි සන්නිය ය. ඔහුට රිරි මුසු සඳුන් ගොටු පුද කෙරේ.

තොර නො වූ ඉසරදයේ නම්, ඉදිමුම් හා ඇහ වෙව්ලුම් ඇති ව, ගිනිජල් වෙළෙන සේ දක්වා නම්, අත් පා සීතල ව, සන්ධි රිදුම්, කොර බව පළ වී නම්, පමණට වැඩිය දිය බොයි නම්, ඒ වාත සන්නිය ය. සුදු බත් ඇතුව තෙල් ගොටු ලැබේ ඒ යකුට.

දුනු කොන්තායුධ හා පොලු ගනිමින්, සිහිනෙන් ඇනුමට එන බව, තොර නොව බඩ ලෙඩ පවතින බව, එලිවන විට, නිදිමත වැඩි බව හා කලු වත් ඇඳි සෙනග මැවී පෙණෙන බව, බස ගොළුවේ කී නම්, ඒ ගොළු සන්නිය ය. ගොළු සන්නි යකු කළු පාටින් බත් ගොටු ලත් කල සැනසේ.

නිතොර ඇහ පලු නගී නම්, ඔක්කාරය ගනී නම් බඩ ලෙඩ දක්වා නම්, ඇහෙහි කස්කිලාස පා නම්, පිස්සු උන්මාද දක්වා නම්, සිනෙන් තුන් මංසල ඇවිදින බවේ නම්, ඒ පිස්සු සන්නිය වේ. සඳුන් ගොටු ලත් කල ඔහු ස නසේ.

බඩ තුළ ගෙඩි පෙරළෙන බවේ නම්, තුන් සැන්දෑවේ ඇවිදුම් රිසි බව පළ වේ නම්, ඇහ ගිනිජල් වෙළෙන සේ පිඩා බව කියා නම්, ඒ මූර්තු සන්නිය වේ. මේ ලෙඩ කළ මූර්තු සන්නි යකු සඳුන් ගොටු දුන් කල සතුටුවේ.

ආයුධයක් ගෙන එන්නෙකු සිහිනෙන් දකින බව හා බඩේ අමියා ඇති බව පළ වේ නම්, උගුරේ ගෙඩි බඩ හා බඩයට කැක්කුම බව කී නම්, සෙනගක් ඇවිදින සේ පෙනේ ය යි පැවසූ නම්, ඒ කෝලසන්නියේ ලකුණුය. වෙඩරු හා කිරි සහිත බත් ගොටු ලත් කල මේ යකු සතුටු වේ.

බඩ වැලෙහි ගෙඩි ගෙන, රහදිව පෙරලීමේ වේ නම්, ගතෙහි සම ඉගිලේ නම්, නාගයන් නිතොරම පෙණේ නම්, අඩ මොර ගසා නම් ඒ නාගසන්නියේ හැටිය. එ ම යකු ආවිට මස් ගොටු ලැබ සතුටු වේ.

ඉස කසා නම්, බඩ රුජාව සමග වමනයේ නම්, ඒ දෙමළ සන්නිය, කියන ලෙඩ, අඹුල් මුසු, සඳුන් ගොටු ලත් කල මේ යකු සතුටුවේ.

බස ගොළු නම්, හා ඇස් දෙක අඳුරුනම්, මුඛයේ කෙළ කැටි ගැසෙන බවේ හා සිහිනෙන් ගැහැණු පෙණෙන බවේ නම්, පිත ඔක්කාර කෙරේ නම්, ඒ බූත සන්නියේ ලෙඩ ය. ඒ යකුට විලඳ ගොටු දීම අවශ්‍ය ය.

කම්මුල් ඉදිමී ගොස් ය. ඇහ කසා පලු මතුවේ. සන්ධි රිදුමෙය. තැඹිලි දිය ඉල්වයි. ඒ අඹුත සන්නිය පාන ලෙඩ ය. කැවුම් සහිත ගොටු මේ යකු රිසි කරනු ලැබේ. ඔහුට එසේ පුද ගොටු දෙයි.

ඉකිලියෙහි ගෙඩි පවතී. වමතේ ද ඇතිව පපුව තුළ ගෙඩි පෙරළෙන සේ වෙයි. සිහි නැතිකම පවතී. ඇහයට පොඩි කිරීම සහ නන් දෙඩවීම පවතියි. ඒ ගිනිජල් සන්නියේ හැටි ය. ඒ යකුට කැඳ සහිත ගොටු ලැබේ.

නිතොර මිනී මරණ බව පවසා නම්, ගෙදොර හා ගම් පාලුව කියවුනි නම්, ඇහ රැඳව ගෙන, ඇහෙන් ලේ පිට වේ යයි පළවුනි නම් ඒ දේව සන්නිය ය. ඒ යකු සුදු බත් දුන් කල සතුටු ය.

මේ වූ පරිදි දහ අට සන්නිය පැමිණ, ඉවර කළ ඇදුරා, පහත එන මේ ආසිරි කව් කියා, දස අට සන්නිය ඉවර කරනු ලැබේ.

අහසේ පොළොවේ සැම දෙවිය න්නේ
මෙරවට හැම තැන දිවස් බල න්නේ
නර ලොව උවදුරු දුරු කර ව න්නේ
කළ ලෙඩ දුර ලං සන්නි යකු න්නේ

දහ අට සන්නිය වෙන වෙන කෙළ එ ති
දහ අට බෝජන වෙන වෙන කැප වෙ ති
දහ අට පඬුරුත් වෙන වෙන කැප දෙ ති
දහ අට සන්නිය ක ළ ලෙඩ දුර ල ති